**වීරකැටිය ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
-----------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 18 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2. අභිතකර මතය
----------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම
------------------------------------------------------------------

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

i. යන්ත්‍රෝපකරණ සහ මෝටර් රථ 13 ක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු. 35,122,110 ක් වූ අතර ශේෂ පත්‍රය අනුව රු. 50,688,000 ක් විය. ඒ අනුව රු. 15,565,890 ක වෙනසක් නිරීක්ෂණය විය.

ii. ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් වටිනාකම් සඳහන් නොවන ඉඩම් හා ගොඩනැගිලි 21 ක වටිනාකම තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර රු. 280,000 ක් වටිනා ඉඩම් 05 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

iii. ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු වටිනාකම සඳහන් නොවූ සුසාන භූමි 22 ක වටිනාකම තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

iv. කොන්දගල පිහිටි පිළිසරු ව්‍යාපෘතියට අදාල ඉඩම හා ගොඩනැගිලි වෙනුවෙන් රු. 6,413,963 ක මුදලක් වැයකර තිබුණද ප්‍රාග්ධනිත කර තිබුණේ රු. 6,100,000 ක් පමණි. ඒ අනුව රු. 313,963 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

v. ප්‍රාදේශීය සභා නව කාර්යාලීය ගොඩනැගිල්ල වටා මායිම් තාප්පය ඉදිකිරීම සඳහා 2013 දෙසැම්බර් 31 දින රු. 326,532 ක් වැයකර තිබුණද එහි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) එකතුව රු. 1,450,288 ක් වූ අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දින වන විට පියවා ඇතත් ඒවා අත්තිකාරම් ගිණුමට බැර නොකර නොපියවූ අත්තිකාරම් ලෙස දක්වා තිබුණි. මේ තුළ ඇතුළත් වූ කාර්යාල උපකරණ මිලදී ගැනිම සඳහා ගෙවන ලද රු. 1,000,000 ක අත්තිකාරම 2013 අගෝස්තු 28 දින පියවා තිබූ අතර 109 වැය විෂයට අදාල වියදම හරකර නොතිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ලී බඩු හා උපකරණ මිලදී ගැනීම සඳහා 2013 වර්ෂයට අදාලව 2014 වර්ෂයේදී ලැබුණ රු. 1,364,893 ක මුදල් සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වර්ෂයේ ණයගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) පිලිසරු ව්‍යාපෘතියට අදාලව සිදුකරන ලද ඉදිකිරීම් වලට අදාලව මධ්‍යම පරිසර අධිකාරියෙන් රු. 213,520 ක් ලැබිය යුතු වුවත් එය රු. 305,195 ක් ලෙස ශේෂ පත්‍රයේ විවිධ ණයගැතියන් යටතේ දක්වා තිබුණි.

(ඉ) අංක 4797677 දරණ ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂ පත්‍රයේ මුදල් යටතේ රු. 666,181 ක් ලෙසද ආයෝජන යටතේ රු. 693,322 ක් ලෙසද ස්ථාන දෙකක් යටතේ දක්වා තිබූ අතර, එම ගිණුම සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොළි අදායම ගිණුම්ගත කිරීමටද කටයුතුකර නොතිබුණි.

(ඊ) ස්ථාවර තැන්පත්, වියදම් ණය හිමියෝ හා ලැබියයුතු **බලපත්‍ර** ගාස්තු යන ගිණුම් වලට අදාලව ප්‍රධාන ලෙජරය හා මුල්‍ය ප්‍රකාශන අතර රු. 17,146,907 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) බැංකු ජංගම ගිණුම් අතර සිදුව තිබුණු මුදල් මාරු කිරීම් නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා සභාවේ ගිණුම් අතර මුදල් හුවමාරු නමින් රු. 5,885,966 ක බැර ශේෂයක් ඇති වී තිබුණු අතර එය ශේෂ පත්‍රයේ කලින් ලැබීම් යටතේ පෙන්වා තිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයෙන් ඉදිරියට ගෙනෙන ලද අවිනිශ්චිත ගිණුමේ රු. 1,229,593 ක බැර ශේෂය ඇති වූ ආකාරය සොයා බලා නිරවුල් කිරීමට කටයුතු නොකර ජර්නල් සටහන් අංක 40 මගින් සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

(එ) 2013 වර්ෂයට අදාල රු. 41,055,000 ක ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත කිරීම සඳහා ජර්නල් සටහන් අංක 35 මගින් ප්‍රාග්ධන වියදම් (309 හා 209 ) හරකර විවිධ ණය හිමියන් බැර කල බව දක්වා ඇතත් ලෙජරයේ ණය හිමියන්ට එම මුදල හර කිරීම නිසා ණයහිමි ශේෂය රු. 82,110,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඔ) වීථි පහන් නඩත්තු කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලංකා විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වියයුතු රු. 95,080 ක මුදල ශේෂ පත්‍රයේ ආදායම් ණයගැතියන් යටතේ දක්වා නොතිබුණි.

(ඕ) ආදායම් ආධාර (5-70) යටතේ වීථි පහන් ප්‍රතිපූර්ණ ආදායම් ලෙස ආදායම් හා වියදම් ගිණුමට රු. 285,240 ක මුදලක් බැරවිය යුතු වුවත් වර්ෂය තුල මුදලින් ලද රු. 342,630 ක මුදලම ආදායමට බැර කර තිබුණි.

(ක) MG/9/11/189 හා MG/09/11/188 යන මගනැගුම ව්‍යාපෘති දෙක සඳහා 2013 ජනවාරි 01 සහ 02 දින මුදල් ලැබී තිබුණි. එම ව්‍යාපෘති දෙක සඳහා එකතුව රු. 948,421 ක් ලැබිය යුතු ලෙස

ශේෂ පත්‍රයේ ආදායම් ණයගැතියන් යටතේ දක්වා තිබුණි. එම මුදල කර්මාන්ත ඉටුකල ගොවි සංවිධාන වෙත ගෙවා තිබුණද ශේෂ පත්‍රයේ ණයහිමියන් යටතේද දක්වා තිබුණි.

(ග) 2013 වර්ෂයට අදාල එකතුව රු. 1,800,000 ක් වු පළාත් නිශ්චිත කර්මාන්ත 02 ක් සඳහා ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

(ච) 2013 වර්ෂයේ සභා අරමුදල් මගින් වීරකැටිය ප්‍රාදේශීය සභා පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. 1,500,000 ක ඇස්තමේන්තුගත මුදලකට 2013 වර්ෂයේ ගිවිසුම්ගත වී තිබු නමුත් ඒ සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

(ජ) 2013 මැයි 29 දින රු. 73,289 ක මුදලක් ජාතිය ගොඩනැගීමේ බදු ලෙස ගෙවා තිබුණද එය ලෙජරයේ ජාතිය ගොඩනැගීමේ බදු පාලන ගිණුමේ ගෙවීම් ලෙස සටහන් කර නොතිබුණු අතර කොන්ත්‍රාත් තැන්පත් ගිණුමට හර කර තිබුණි.

(ට) ජර්නල් සටහන් අංක 32 අනුව දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ආරම්භක ශේෂය නිවැරදි කිරීම සඳහා රු. 44,041,586 ක මුදලක් දේශීය ණය හා සංවර්ධන අරමුදල හර කර සමුච්චිත අරමුදල බැර කර තිබුණද එය රු. 43,381,002 ක් ලෙස නිවැරදි විය යුතු විය. ඒ අනුව රු. 660,584 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඩ) ජර්නල් සටහන් අංක 31 අනුව ආදායම් හා වියදම් ගිණුමට රු. 289,100 ක් බලපත්‍ර ගාස්තු ආදායම් (2-30) ලෙස බැරවිය යුතු වුවත් රු. 686,507 ක මුදලක් බැරකර තිබුණි.

### 1.3.3 නොසැසඳුනු පාලන ගිණුම්

-------------------------------

ගිණුම් විෂයයන් 7 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම සහ උපයෝගී ලේඛන අනුව වටිනාකම අතර රු. 4,205,247 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

එකතුව රු. 1,862,908 ක් වු ගිණුම් විෂයයන් 3 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කළ නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු. 7,780,023 ක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 81,229,174 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| i. | වරිපනම් හා බදු | 1,892 | 858 | 3,480 |
| ii. | බදුකුලී | 24,481 | 16,854 | 3,228 |
| iii. | වෙනත් ආදායම් | 26,973 | 24,968 | 57,825 |

### 2.2.2 වරිපනම් බදු

(i) සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ වරිපනම් බදු ආදායම රු. 3,480,390 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට වූ රු. 3,480,390 වරිපනම් බදු හිඟය තුළ වූ රු. 5,000 ට වැඩි ශේෂ සම්බන්ධයෙන් කල පරීක්ෂාවේදී ඒකක 68 කින් රු. 628,083 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

(iii) 2002 වර්ෂයේ කරන ලද වරිපනම් බදු තක්සේරුව මත 2013 වර්ෂයේදීද වරිපනම් බදු අයකර තිබුණ අතර නව තක්සේරුවක් සිදුකර ඒ මත වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 කඩ කාමර කුලී

(i) පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ජනවාරි 01 දින අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 05 උපවගන්තිය අනුව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත් සභාව සතු පස්මංහන්දිය කඩකාමර 4 හා පොදු වෙළඳ පල කඩකාමර 7 සම්බන්ධයෙන් අදාල ගිවිසුම් වසර 25 කට වඩා පැරණි වන අතර එකී ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ඉහත චක්‍රලේඛයේ 02,03 හා 05 වගන්ති අනුව තක්සේරු කරුවෙකු ගෙන් ලබාගත් තක්සේරුව මත කඩකාමර කුලී තීරණය කලයුතු අතර තක්සේරු බදුකුලිය සභා සම්මතයක් මගින් තහවුරු කලයුතු විය. එකී චක්‍රලේඛයේ 6 වගන්තිය අනුව යටත් පිරිසෙයින් වසර 05 කට වරක්වත් තක්සේරුගත බදු මුදල නව තක්සේරුවක් මගින් සංශෝධනය කලයුතු බවද දන්වා ඇත. එසේ වුවද 2013 වර්ෂයේදී අයකරනු ලබන කඩකාමර කුලී සඳහා විධිමත් තක්සේරුවක් ලබාගෙන නොතිබුණි.

(iii) කඩකාමරවල කුලී මුදල 2006 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2005 වර්ෂයේදී වැඩිකර තිබූ නමුත් එම කුලී තීරණය කල ආකාරයද එකී නව කුලී ඇතුළත් කර ඇති ගිවිසුම්ද විගණනයට ඉදිරිපත් නොවූ අතර පොදු වෙළඳ පොල කඩකාමර 05 ක පැරණි ගිවිසුම්ද විගණනය වෙත ඉදිරිපත් නොවුනි.

### 2.2.4 යන්ත්‍රෝපකරණ ගාස්තු

සමාලෝචිත වර්ෂය අවසානයට බාහිර පාර්ශවයන්ගෙන් සහ සභාවේ සේවයේ නියුතු අයගෙන් අයවිය යුතු රු. 1,008,296 ක් වූ හිඟ යන්ත්‍රෝපකරණ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 අක්කර බදු**

**------------**

සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට හිඟ අක්කර බදු ආදායම රු. 43,303 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 9,614,682 ක මුදලක් උසාවි දඩ හා මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-------------------------------------**

(I) ප්‍රාදේශීය සභාව විසින් 2013 දෙසැම්බර් 31 දක්වා අයකරනු ලැබූ එකතු කල අගය මත බදු , ජාතිය

ගොඩනැගීමේ බදු සහ මුද්දර ගාස්තු එකතුව රු. 6,256,245 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(II)** 2013 වර්ෂයේ අයවැය යෝජනා අනුව 2013 ජනවාරි 01 සිට ජාතිය ගොඩනැගීමේ බදු අය නොකරන ලෙස දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දන්වා ඇතත් ඊට පටහැනිව ගාස්තු අයකිරීම නිසා වීරකැටිය, මොරයාය හා ජුලම්පිටිය පොදු වෙළඳපල බදුකරුවන්ගෙන් රු. 85,773 ක මුදලක් වාරික මුදල් ලෙස වැඩිපුර අයකරගෙන තිබුණි.

**(III)** සභාව සතු කැබ්රථ 01 ක් , ට්‍රැක්ටර් 05 ක් , ජේසීබී 02 ක් , ජල බවුසර් 01 ක් හා මෝටර් ග්‍රේඩර් 01 ක් සඳහා වර්ෂ ගණනාවක සිට ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

නිකුත් කල නමුත් කල් ඉකුත් වූ එකතුව රු. 223,418 ක චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**(අ) නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

**---------------------------------------------------**

රු. 87,189 ක් වූ ජල උපකරණ සහ නළ ළිං උපකරණ තොග නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

**(ආ) අලුත්වැඩියාව සඳහා යොමුකල ඡායා පිටපත් යන්ත්‍රය**

**--------------------------------------------------------**

සභාව සතු වූ කැනෝන් 7160 දරන ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කර ගැනීමට 2007 දෙසැම්බර් 28 දින මාතර මෙට්‍රොපොලිටන් ආයතනය වෙත යවා ඇති නමුත් විගණිත දිනය වූ 2014 ජුනි 26 දින වන විටත් එය අලුත්වැඩියා කර සභාව වෙත රැගෙන ඒමට කටයුතු කර නොතිබුණි.

**3.4 නව කාර්යාල ගොඩනැගිල්ලට වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම**

නව කාර්යාල ගොඩනැගිල්ලට වායු සමීකරණ යන්ත්‍ර මිළදී ගැනීම වෙනුවෙන් රු. 980,200 ක බිල්පතක් ලැබී තිබුණ අතර මින් රු. 500,000 ක් 2013 සැප්තැම්බර් 13 දින පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 208 අනුව මිළදී ගැනීමේ ප්‍රමාණය රු. 50,000 ඉක්මවනු ලබන්නේ නම් ඒ පිළිබඳව ටෙන්ඩර් දැන්වීම් පුවත්පත්වල පල කළයුතු වුවත් එසේ නොකර ඒ පිළිබඳ දැන්වීම් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල, වලස්මුල්ල උපකාර්යාලයේ හා වීරකැටිය , වලස්මුල්ල ගොවිජන සේවා කාරක සභාවල ප්‍රදර්ශනය කර තිබුණි.

ii. 2006 රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.14.1 අනුව රු. 250,000 ට වැඩි මිළදි ගැනීම් සඳහා අවම වශයෙන් මිල ගණන් 05 ක් ලබාගත යුතු වුවත් ලැබී තිබුණේ මිළ ගණන් 03 ක් පමණි.

iii. අදාල සේවා සපයන ආයතනය සමඟ ගිවිසුමකට එළඹී නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

අයවැය ලේඛනයෙන් අපේක්ෂා කළ පරිදි ඇස්තමේන්තුගත ආදායම් ලැබී නොතිබු බවත් ඇතැම් වියදම් විෂයයන් වල විශාල ඉතිරි කිරීම් තිබු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවත් නිරීක්ෂණය නොවුනි.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ආදායම් පරිපාලනය